
www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

**ඓතිහාසික මුසාකරනයේ සේවය සඳහා**
In The Service of Historical Falsification

# රොබට් සර්විස්ගේ ට්‍රොට්ස්කි: චරිතාපදානය


**A Review of Robert Service's *Trotsky: A Biography***

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2009 නොවැම්බර් 11**




*("ලියොන් ට්‍රොට්ස්කි හා ඓතිහාසික මුසාකරනයේ පශ්චාත් සෝවියට් ගුරුකුලය" ද කියවන්න)*

*Trotsky: A Biography* (ට්‍රොට්ස්කි): චරිතාපදානයක්
රොබට් සර්විස්
හාවඩ් විශ්වවිද්‍යාල මුද්‍රනාලය
කේම්බ්‍රිජ්, මැස්සචුසෙට්ස්, 2009





### ලියොන් ට්‍රොට්ස්කිගේ අවතාරය

නූතන ඇමෙරිකානු නව-සංස්ථිතිකවාදයේ බුද්ධිමය ගැලවුම්කාර ජේම්ස් බර්න්හැම්, ලියොන් (ලෙව් ඩැවිඩොවිච්) ට්‍රොට්ස්කි පිලිබඳ අයිසැක් ඩොයිස්චර්ගේ අනුස්මරනීය ජීවන චරිතාපදානයේ පලමුවැනි වෙලුම වන *The Prophet Armed,* (සන්නධ වූ අනාගත වක්තෘ) නැමැති කෘතිය 1955 වසරේ දී සමාලෝචනය කලේ ය. ඒ වන විට, බර්න්හැම් හතරවැනි ජාත්‍යන්තරයෙන් ඉල්ලා අස්වී වසර 15 ක් ගෙවී තිබිනි. ඔහු ලියොන් ට්‍රොට්ස්කි සමග ගෙනගිය විවාදශීලි කඩු හරඹයේ දේශපාලන අරගලයක කූටප්‍රාප්තිය එය විය. එය බර්න්හැම්ට අමිහිරි අත්දැකීමක් විය. ට්‍රොට්ස්කි සමග යෙදුනු මේ දේශපාලනික හා බුද්ධිමය තරගය තුල එක්තරා නොගැලපීමක් ඔහුට දැනී තිබුනි. ට්‍රොට්ස්කි වෙත යොමු කරන ලද ලිපියක බර්න්හැම් මෙසේ ලියා තිබුනි. "ඔබ නිර්මානය ලද වාචික ව්‍යුහයේ තාක්ෂනික පරිපූර්නත්වය, ඔබේ අලංකාරෝක්තියේ ගතික පරාසය, සමාජවාදී පරමාදර්ශය වෙනුවෙන් ඔබේ අවිවාදිත කැපවීමේ දැඩි ප්‍රකාශනය, ඔබ ලිවූ පිටුගනන් හරහා දිවෙන හාස්‍යෝත්පාදක හා බැබලෙන රූපාලංකාරයන්ගේ දීප්තියෙන් මවිතයට පත්ව මම මඳකට ගල්ගැසුනෙමි." **(1)**

(ට්‍රොට්ස්කි අනාවැකි පල කල පරිදි) බර්න්හැම්, සමාජවාදය ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව අන්ත දක්ෂිනාංශය කරා වේගයෙන් ඇදී ගියේය. 1950 ගනන්වල මැද භාගය වන විට ඔහු, ට්‍රොට්ස්කිගේ ජීවිතය හා කාර්යය සාධනය නිරීක්ෂනය කලේ මාක්ස්වාදයට එරෙහි ගෝලීය අරගලයකට තමන්ගේම දෘෂ්ටිමය කැපවීමේ ප්‍රිස්මය තුලිනි. ඩොයිෂ්චර්ගේ කෘතිය ඔහු තුල සංත්‍රාසයක් ඇති කලේ ය. එය ස්වභාවයෙන් බුද්ධිමයමය ගැටලුවක් නොවීය.

ට්‍රොට්ස්කිගේ විප්ලවකාරී පුද්ගලත්වය අරභයා කතුවරයාගේ තීක්ෂන ප්‍රතිනිර්මානය බර්න්හැම් අනායාසයෙන්ම පිලිගත්තේ ය.



අයිසැක් ඩොයිෂ්චර්

"ට්‍රොට්ස්කි, පිලිබඳ වෘතාන්තය ඩොයිෂ්චර් මහතා විසින් වාත්තු කර ඇත්තේ ග්‍රීක වාත්තු නිර්මානයක් තුල පවතින්නාක් වැනි, එයට ප්‍රමානවත් සාධාරනයක් ඉටු කරමින්" යයි බර්න්හැම් ලිවී ය. "දිදුලන විශිෂ්ටත්වයෙන් හෙබි නායකයෙක් ලෙස ඔහු ඉදිරිපත් කරන ට්‍රොට්ස්කි, 1905, 1917 වසරවල හා සිවිල් යුද්ධය තුල අනුක්‍රමයෙන් උච්චස්ථානයන්ට නැගී ගිය අතර, එහිදී ඔහු ඉතිහාසය හා සංයෝජනය වෙමින් එහි හඬ බවට පත් වෙයි." ට්‍රොට්ස්කිගේ අසාමාන්‍ය ගුනාංග පිලිබඳව පාඨකයින් දැනුවත් කිරීමෙහි ලා කතුවරයා සාර්ථක වී ඇති බව බර්න්හැම් පිලිගනී. "ඔහුට සවන් දුන් බොහෝ අය අපගේ සියවසෙහි ප්‍රබලතම යයි විශ්වාස කල දීප්තිමත් කථිකත්වය; ව්‍යක්ත භාෂා විලාසය; හාස්‍යොත් පාදක හා දෙදරුම්කන ගද්‍යය; සෑම නව විෂයක් ම ප්‍රගුන කිරීමෙහිදී ට්‍රොට්ස්කිට පැවති වේගය; කැපවුනු විප්ලවවාදීන් අතර බෙහෙවින් විරල වූ, සිය උත්සුකයන් පිලිබඳව පැවති පෘතුලභාවය."

ඩොයිස්චර් විසින් ඉදිරිපත් කරන ලද ට්‍රොට්ස්කි පිලිබඳ චිත්‍රය පැත්තකට බර වූවක් නොවන බව බර්න්හැම් සටහන් කලේ ය; "හෘද සාක්ෂියට අනුකූලව, ඔහු ට්‍රොට්ස්කිගේ දුබලකම් ද විදහා දක්වයි." චරිතාපදානයේ බොහෝ බුද්ධිමය ගුනාංග තිබියදී වුවත් එය, "බුද්ධිමය ව්‍යසනයක්" ලෙස බර්න්හැම්ගේ හෙලා දැකීමට ලක්විය."ඩොයිෂ්චර් මහතා ලියන්නේ බොල්ශෙවික් විප්ලවය පිලිගන්නා හා සුජාතකරන ස්ථාවරයක් මත පිහිටාය" යන්න සිය දෝෂාරෝපනයට බර්න්හැම් දැක්වූ හේතුවයි. "ඓන්ද්‍රීයව ම දුර්වර්න වූ චරිතාපදානය පිලිගත නොහැක්කකි. "එහි ඇති බෝල්ශෙවික් පැල්ලම සෝදා හැරීමට සියලුම පුස්තකාලවලින් ලබාගතහැකි සියලු ශාස්ත්‍රීය අධ්‍යයනයන් පවා ප්‍රමානවත් නොවනු ඇත."

"අපගේ ප්‍රමුඛ පෙලේ පර්යේෂන ආයතනවල සියලු අනුග්‍රහය ද, අපගේ පදනම් ආයතනවල ආධාර ද, අපගේ සඟරාවල පිටුගනන් ද, ප්‍රබල ඇංග්ලෝ-සැක්සන් ඔක්ස්ෆර්ඩ් මුද්‍රනාලය මගින් එය ප්‍රකාශයට පත් කිරීම හා ප්‍රවර්ධනය කිරීමේ ද අවස්ථාව ඩොයිෂ්චර්ට හිමිව තිබීම" පිලිබඳව බර්න්හැම් සිය භීතිය පල කලේ ය. ට්‍රොට්ස්කිගේ වික්‍රමාන්විත ජීවිතය හා විප්ලවකාරී දෘෂ්ටීන් පිලිබඳ විස්තර පුලුල් ජනතාව, විශේෂයෙන්ම තරුනයින් වෙත ගලායාමට ඉඩ සැලසීමෙන් හා අනුබලදීමෙන් පවා, ඇතිවිය හැකි අන්තරාය නිල සංස්ථාපිතය විසින් හඳුනා නොගත්තේ ද?

බර්න්හැම් සිය සමාලෝචනය අවසාන කලේ අපේක්ෂාභංගයේ හඬක් නගමින්: "(ඩොයිෂ්චර්) සාකච්ඡා කරන අතිශය වැදගත් කරුනු පිලිබඳ ඔහුගේ අදහස් මගින්, අපගේ විශ්වවිද්‍යාල ශිෂ්‍යන්ගේ ද බුද්ධිමන්ඩලවල ද සිතුම් පැතුම් කෙරෙහි ගැඹුරු බලපෑමක් ඇති කරයි. මෙය සැබැවින්ම බටහිර ලෝකයේ ආත්ම නාශක උන්මාදයේ සුලබ ඇඟවුම් අතුරෙන් තවත් එකකි."(2) නිසැකව ම මේ සමාලෝචනය තුලින් ගලා එන නිගමනය නම්, ඔක්තෝබර් විප්ලවය හා එහි නායකයින් කෙරෙහි මනාපය පල කරන ඩොයිෂ්චර්ගේ කෘතිය හා එවැනි අනිකුත් කෘති පල නොකල යුතු ය යන්නය.

යටත් පිරිසෙයින් ඔහුගේ දේශපාලන දෘෂ්ටි ආස්ථානයට අනුව බර්න්හැම් පල කල භීතියේ සාධාරනයක් නැත්තේ ද නොවේ. දැවැන්ත ස්ටැලින්වාදී මුසාවාද ගොඩක් යට දශක ගනනාවක් පුරා වලදමා තිබුනු ට්‍රොට්ස්කිගේ ඓතිහාසික භූමිකාව හා දේශපාලන දෘෂ්ටීන්, ට්‍රොට්ස්කි පුනරුත්ථාපනය කිරීම තුලින් පෙරලිකාරී ලෙස යලි හිස එසවීමේ විභවය ඔහු කල්තබා ම දැකගත්තේ ය. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයෙහි 20 වැනි සම්මේලනය ඉදිරියේ කෲෂෙව් විසින් 1956 වසරේ පෙබරවාරියේ කරන ලද "රහස්‍ය දේශනයෙන්" ස්ටැලින් සමූලඝාතකයෙක් බව පිලිගැනුනු අතර එමගින් ආඥාදායකයාගේ අනුකම්පා විරහිත විරුද්ධවාදියා විසින් විසි වසරකට පෙර නිකුත් කරන ලද චෝදනා පත්‍රය සාධාරනය කෙරුනි. ඉන් ඉක්බිතිව ගෙවුනු වසර ගනනාව තුලදී. ලියොන් ට්‍රොට්ස්කිගේ දේශපාලන ආයාමය ලොව පුරා වේගයෙන් වර්ධනය විය.

වර්ධනය වන කම්කරු පන්ති සටන්කාමීත්වයේ හා තරුන රැඩිකලීකරනයේ පසුබිම තුල, ඩොයිෂ්චර්ගේ තුන් ඈඳිති චරිතාපදානය මඟින් - ( *The prophet Armed,* (සන්නද්ධ වූ අනාගත වක්තෘ,) *The prophet Unarmed,* (නිරායුධවූ අනාගත වක්තෘ) හා *The Prophet Outcast* (පිටමං කල අනාගත වක්තෘ) - ලියොන් ට්‍රොට්ස්කිගේ කාර්යසාධනය හා අදහස්, නොගිනිය හැකි දහස් ගනන් තරුනයින්, බුද්ධිමතුන්

හා කම්කරුවන් හමුවට ගෙන ආවේය. තමන් ට්‍රොට්ස්කිගේ දේශපාලන උරුමය මත පදනම් වන බව ප්‍රකාශ කල සංවිධාන, 1960 හා 1970 ගනන් තුල කැපීපෙනෙන අන්දමින් වැඩී ගියේය. මෙය බ්‍රිතාන්‍ය සම්බන්ධයෙන් විශේෂත්වයකි. 1964 තරම් මෑතකදී, බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂයේ තරුන ව්‍යාපාරය වූ තරුන සමාජවාදියෝ සංවිධානයේ නායකත්වය, ට්‍රොට්ස්කිවාදී සෝෂලිස්ට් ලේබර් ලීගය අතට පත්විය. 1960, 1970, හා 1980 ගනන් පුරා ද එම් අයි 5 නම් බ්‍රිතාන්‍යයේ ප්‍රධාන ඔත්තු සේවයේ ප්‍රධාන කර්තව්‍යන්ගෙන් එකක් වූයේ ට්‍රොට්ස්කිවාදී සංවිධානවල කටයුතු පිලිබඳව අවධානයෙන් පසුවීමයි. (**3**)

### ට්‍රොට්ස්කිට එරෙහි නව ප්‍රහාරයක්

විශේෂිත වූ බුද්ධිමය ප්‍රපංචයක් සැලකිල්ලට ගන්නා විට යමෙක්, මෙම ඓතිහාසික අත්දැකීම සිහිපත් කිරීම වටී: එනම්, පස් වසරකට මදක් වැඩි කාල පරාසයක් තුල, බ්‍රිතාන්‍ය ඉතිහාසඥයින් විසින් ලියොන් ට්‍රොට්ස්කිගේ ජීවන චරිතාපදානයන් තුනක් ප්‍රකාශයට පත් කර තිබීමයි. 2003 වසරේ දී, ලයිසෙස්ටර් විශ්ව විද්‍යාලයේ (ඊට කලින් ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයේ) මහාචාර්ය ඉයන් තැචර් රුට්ලෙජ් විසින් ප්‍රකාශයට පත් කරන ලද ඔහුගේ *Trotsky* (ට්‍රොට්ස්කි) නැමැති කෘතිය එලි දැක්විය. ඉන් වසර තුනකට පසුව, ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයේ ජෙෆ්රි ස්වේන්ගේ *Trotsky 'ට්‍රොට්ස්කි'* නැමැති කෘතිය ලෝංමන් විසින් ප්‍රකාශයට පත් කලේ ය. දැන්, 2009 වසර අවසානවෙත්ම, ඔක්ස්ෆඩ්හි සාන්ත අන්තෝනි විද්‍යාලයේ මහාචාර්ය රොබට් සර්විස් විසින් රචිත *Trotsky: A Biography* (ට්‍රොට්ස්කි: ජීවන චරිතාපදානයක්) යන කෘතිය මහත් හරසරින් එලිදක්වන්නට යෙදුනි. එහි බ්‍රිතාන්‍ය ප්‍රකාශකයා වන්නේ මැක්මිලන් ය. එක්සත් ජනපදය තුල සර්විස්ගේ කෘතිය පල කර ඇත්තේ හාවඩ් විශ්වවිද්‍යාලයේ මුද්‍රනාලය මගිනි. වසර 70 කට ආසන්න කලකට පෙර අභාවප්‍රාප්ත වූ ලියොන් ට්‍රොට්ස්කි පිලිබඳ බ්‍රිතාන්‍ය ශාස්ත්‍රඥයින්ගේ මේ ප්‍රකාශිත උනන්දුවට පාදක වූයේ කුමන කරුනු ද?

මේ සමාලෝචකයා විසින් මීට පෙර අවස්ථාවකදී, තැචර් හා ස්වේන්ගේ කෘතීන් පරිපූර්න විශ්ලේෂනයකට ලක් කොට, ඒවා ලියොන් ට්‍රොට්ස්කිගේ ජීවිතය හා අදහස් පිලිබඳව ඉගෙනීමට උනන්දුවන කිසිවෙකුටත් කිසිදු වටිනාකමක් නොමැති ඓතිහාසික මුසාකරනයේ මුග්ධ අභ්‍යාසයන් බව ඔප්පු කොට ඇත. බර්න්හැම්ගේ අනතුරු ඇඟවීම සැලකිල්ලට ගත් සෙයක් පෙන්නුම් කරමින්, ට්‍රොට්ස්කිට වේදිකාවක් නොසැපයීමට, තැචර් හා ස්වේන් තීරනය කර තිබුනි. එමනිසා, ඔහුගේ ලියවිලිවලින් උපුටා දැක්වීම් හැකිතාක් දුරට සීමා



**ට්‍රොට්ස්කි**

කිරීමට මේ දෙදෙනා සැලකිලිමත් වූහ. කෘතීන් දෙකම ඩොයිෂ්චර්ගේ ප්‍රබල තුන්ඇඳියෙන් ඉස්මතු වූ ට්‍රොට්ස්කිගේ ජනප්‍රිය ප්‍රතිරූපය උඩුයටිකුරු කිරීම අරමුනු කොට ගත්හ. විප්ලවවාදියෙකු, මාක්ස්වාදී න්‍යායාචාර්යවරයෙකු, මිලිටරි නායකයෙකු, දේශපාලන විශ්ලේෂකයෙකු හා ඒකාධිපති නිලධරයේ විරුද්ධවාදියෙකු වශයෙන් ට්‍රොට්ස්කිගේ "පුරානෝක්තිය" නිර්මානය කිරීම පිලිබඳව තැචර් හා ස්වේන්, ඩොයිෂ්චර්ට අපහාසාත්මකව සැලකීය. සමකාලීන කොමියුනිස්ට් විරෝධයේ උවමනාකම්වලට ගැලපෙන පරිදි, පැරනි ස්ටැලින්වාදී පන්නයේ අපවාද හා බොරු ප්‍රබන්ධ උපයෝගී කර ගනිමින් නව ට්‍රොට්ස්කි විරෝධී වෘතාන්තයන් නිර්මානය කිරීමට තැචර් - ස්වේන් සිය ට්‍රොට්ස්කි චරිතාපදානයන් යොදා ගත්හ. (**4**)

දැන් එලියට එන්නේ ලියොන් ට්‍රොට්ස්කිගේ ඓතිහාසික කීර්තිය කඩා බිඳ දැමීම සඳහා කෙරීගෙන යන උත්සාහය වෙනුවෙන් රොබට් සර්විස්ගේ දායකත්වයයි. ප්‍රකාශනයට පෙර නිතුත් කරන සිය ප්‍රවර්ධනාත්මක ලියවිලි තුලින්, හාවඩ් විශ්වවිද්‍යාල මුද්‍රනාලය මෙසේ ප්‍රකාශ කර සිටියි. "ඔහුගේ අනුගාමිකයින් ට්‍රොට්ස්කි, ස්ටැලින්ගේ දඩයමට ලක්ව රටින් පිටුවහල් කරන ලද, පවිත්‍ර විප්ලවවාදියෙකු හා ප්‍රබල බුද්ධිමතෙකු ලෙස සලකන අනම්‍ය මතයෙහි එල්බගෙන සිටිය ද, යථාර්ථය ඊට බොහෝ සෙයින් වෙනස් ය. එම මිනිසා සහ ඔහුගේ උරුමය පිලිබඳව (සර්විස්) ආලෝකමත් කරන චිත්‍රය, එම වාර්තාව නිවැරදි කරයි." සැබැවින්ම එය එසේ කරයි ද?

### චරිතාපදානය චරිත ඝාතනයක් ලෙස

*Trotsky: A Biography* (ට්‍රොට්ස්කි: චරිතාපදානයක්) බුද්ධිමත්භාවයේ ඉතා අවම ප්‍රමිතීන් පිලිබඳව හෝ සැලකිල්ලක් නොදක්වා නිපදවන ලද අශිෂ්ඨ හා පහර ගැසීමේ අරමුනෙන් යුත් කෘතියකි.

සර්විස්ගේ "පර්යේෂනය" - කෙනෙකු එය එසේ හැඳින්වීමට කැමැත්තක් දක්වනේ නම් - මහෙයවා ඇත්තේ වංක චේතනාවෙනි. ඔහුගේ 'ට්‍රොට්ස්කි' කෘතිය තුල ඉතිහාසය නොමැති අතර එය චරිත ඝාතනයේ ස්වභාවයෙන් යුත් ව්‍යායාමයකි. ට්‍රොට්ස්කිගේ දේශපාලන කාර්ය සාධනය හා අදහස් විකෘති කිරීමෙන් හා බොරුකිරීමෙන් සර්විස් සෑහීමකට පත් නොවේ. සිල්ලර කඩයක අලෙවියට තබා ඇති ටැබ්ලොයිඩ් පුවත්පතක පහත් මට්ටමට නිරන්තරයෙන් වැටෙන සර්විස්, ට්‍රොට්ස්කිගේ පෞද්ගලික ජීවිතය මත කැත කුනු තවරයි. ඔහුගේ ප්‍රියතම උපක්‍රමයක් වන්නේ ට්‍රොට්ස්කිගේ පෞද්ගලික සම්බන්ධතා පිලිබඳව සඳහන් වන "දූෂමාන ආරංචි" තලුමැරීමයි. ඔහු එසේ කරන්නේ එම දූෂමාන ආරංචිවල විශ්වාසනීයත්වය තහවුරු කිරීම කෙසේ වෙතත්, ඒවායේ මූලාශ්‍රයන් හඳුන්වා දීමට පවා සැලකිලිමත් නොවෙමින්ය.

ස්ටැලින් තන්ත්‍රයේ අපවාදවලට එරෙහිව තමා වෙනුවෙන් කරුනු දක්වමින් ට්‍රොට්ස්කි වරෙක ප්‍රකාශ කර සිටියේ "මගේ විප්ලවවාදී ගරුත්වය මත එකඳු කැලලක්වත් නැත" යනුවෙනි. එසේ වුව ද සර්විස්, ට්‍රොට්ස්කි සිතුවම් කරන්නේ කිසිදු කීර්තියකට හිමිකම් නොකියන පුද්ගලයෙකු ලෙස ය. විප්ලවවාදී දේශපාලනඥයෙකු වශයෙන් පමනක් නොව, මිනිසෙකු වශයෙන් ද ට්‍රොට්ස්කිට අවමන් කිරීමට ඔහු යත්න දරයි. සර්විස් හඳුන්වා දෙන ට්‍රොට්ස්කි, කිසිදු අනුකම්පාවක් නොමැති, පුහුමානයෙන් යුත් පුද්ගලයෙකි. සිය මමංකාරී අරමුනු වෙනුවෙන් සිය සහකරුවන් යොදාගත් ඔහු දයා විරහිතව සිය බිරිඳ අත්හල ද්‍රෝහී ස්වාමිපුරුෂයෙකි. සිය දරුවන් කෙරේ කිසිදු තැකීමක් නොදැක්වූ, ඔවුන්ගේ මරනවලට පවා වගකිව යුතු පියෙකි. "ඔහු කෙතරම් පුහුමානයෙන් යුත් හා ආත්මාර්තකාමී පුද්ගලයෙක්දැයි හඳුනා ගැනීමට මිනිසුන්ට වැඩි කලක් ගත වුයේ නැතැ"යි ට්‍රොට්ස්කි පිලිබඳ සංකේතාත්මක උද්ධෘතයක සර්විස් ලියා ඇත. [56]

සර්විස්ගේ චරිතාපදානය එවැනි නොවැදගත් අපහාසවලින් පිරී ඇත. ට්‍රොට්ස්කි "චපල හා විශ්වාස නොකට යුතු පුද්ගලයෙක්" විය. "ඔහු, තම අදහස් විචිත්‍රවත් භාෂාවෙන් ප්‍රකාශ කල හොත් තමන්ට ජය ගැනීමට හැකිවේ ය යන මමත්වයෙන් පිරි අහංකාර පුද්ගලයෙක් විය. ඔහුගේ ස්වයං තෘප්තිය ආන්තික ස්වභාවයක් ගත්තේ ය. ඔහු සිය පලමු බිරිඳට සැලකුවේ අශෝභන ලෙස ය. විශේෂයෙන් ඔහුගේ දේශපාලන අවශ්‍යතාවයන් මැදිහත් වූ විට ඔහු සිය දරුවන්ගේ අවශ්‍යතාවන් නොසලකා හැරී ය." [4]

සර්විස් සිය පාඨකයින්ට ඒත්තු ගැන්වීමට තැත්කරන්නේ, ට්‍රොට්ස්කිගේ බුද්ධිමය හා දේශපාලනික ජීවිතය ඔහුගේ පෞද්ගලික ජීවිතය තරමට ම අශෝභන වූ බවකි. "සිවිල් යුද්ධය තුලදී, ආඥාදායකත්වය හා ත්‍රස්තය කෙරේ ට්‍රොට්ස්කිට පැවති දැඩි ආශාව යටපත්ව තිබුනේ යන්තමිනි. කාර්මික කම්කරුවන් ද ඇතුලු දස ලක්ෂ සංඛ්‍යාත ජනකායකගේ සිවිල් අයිතීන් ඔහු පාගා දැමීය." පසුව සිදුවුනු ඔහුගේ දේශපාලන පරාජය සම්බන්ධයෙන් ගත් කල, සෝවියට් නිලධාරී තන්ත්‍රයේ වර්ධනය හා එය දේශපාලන බලය අත්පත් කර ගැනීම පිලිබඳ ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනය සර්විස් කිසිදු තර්කයකින් තොරව ම ඉවතලයි. ප්‍රත්‍යක්ෂ යමක් කියා සිටින්නාක් මෙන් සර්විස් හුදෙක්ම කියා සිටින්නේ, "සෝවියට් සංගමයේ පොදු ජනතාවගේ ජීවිතය පිලිබඳව වඩා උසස් අවබෝධයක් ඇති පුද්ගලයෙකු (ස්ටැලින්) හා ඔහුගේ කල්ලියට ට්‍රොට්ස්කි පරාජය වු බවය." [4]

සර්විස්ට අනුව, ට්‍රොට්ස්කි දෙවැනි හෝ තෙවැනි පෙලේ චින්තකයෙකුට වැඩිමනත් යමෙකු නොවී ය. ට්‍රොට්ස්කි "බුද්ධිමය අපූර්වත්වයකට හිමිකම් කී අයෙකු ද නොවී ය. එසේ කිරීමට උත්සහයක් දැරුවේ නම් ඔහු සමච්චලයට ලක්වනු නො අනුමානය" යි ඔහු ලිවීය. [109] "බුද්ධිමය වශයෙන් ඔහු මාතෘකාවෙන් මාතෘකාවට පැන පැන සිටි අතර, ඔහුගේ චින්තනය ක්‍රමවත් කිරීමට උත්තේජනයක් ඔහුට නොදැනුනි." [110] ට්‍රොට්ස්කි වේගයෙන් එහෙත් නොගැඹුරු ලෙස ලිවී ය. "උල්පත් පෑනක් අතැතිව මේසයක් අසල වාඩි වී අලුත්ම ප්‍රබන්ධය කුරුටුගාමින් සිටීමට ඔහු හුදෙක්ම ඇලුම් කලේ ය. ඔහුගේ මනස තුල වචන ගලායන විට ඔහුට බාධා කිරීමට තරම් කිසිවෙකු දිරිමත් නොවීය." [319] මේ "කුරුටුගෑමේ" ප්‍රතිඵලය කුමක්වී ද? සර්විස් මෙසේ ලියයි: "ඔහුගේ චින්තනය වියවුල් සහගත හා කඩමාලුවලින් පිරි මල්ලක් විය." [353] "ඔහු වැඩි කාලයක් ගත කලේ විවාද කරමිනි, චින්තනයට ඉතිරි වූයේ සුලු කාලයකි. අන්තර්ගතය අභිබවා ගියේ ශෛලියයි. මෙයට බැඳී තිබුනේ, බුද්ධිමතෙකු වශයෙන් කිසිදු බැරෑරුම් කමක් නොමැතිවීමයි." [356] 20 වැනි සියවසේ ශ්‍රේෂ්ඨතම ලේඛකයෙකු ලෙස සැලකිය යුතු මිනිසකුගේ බුද්ධිමය වැඩකොටස පිලිබඳව සර්විස්ගේ විනිශ්චය එසේ විය.(**5**)

චරිතාපදාන කතුවරයෙකු තමන්ගේ විෂය කෙරෙහි කැමැත්තක්, හෝ ගෞරවයක් පවා, ඇති කරගැනීමට අවශ්‍ය නැත. වසර ගනනාවක පර්යේෂනයක නිමැවුමක් වු ඇඩොල්ෆ් හිට්ලර්ගේ ජීවිතය භාරා ඇවිස්සීම සඳහා අසාමාන්‍ය වෙලුම් දෙකක් කැප කල ඉයන් කර්ෂෝට හිට්ලර් කෙරේ මඳ හෝ අනුවේදනයක් තිබුනි යයි කිසිවෙකු යෝජනා නොකරනු ඇත. එසේ වුවත් චරිතාපදාන කතුවරයෙකු සිය ශාස්ත්‍රීය අවධානයට ලක් වූ වස්තු විෂය අගය කල ද පිලිකුල් කල ද, නැතහොත් ඒ අරහයා නිසල හා උපේක්ෂාසහගත හැඟීමක් ඇත්තේ වුවද, කරුනු කාරනා සහිත වාර්තාවට ඔහු ගරු කල යුතු අතර එම පුද්ගලයා අවබෝධ කරගැනීමට ද යත්න දැරිය යුතුය.

තමන්ට විෂය වන පුද්ගලයා ජීවත්වූ අවධියේ පැවති තත්වයෙහි සන්දර්භය තුල ඔහුගේ ජීවිතය පිරික්සීමේ වගකීම චරිතාපදාන කතුවරයා සතුය. එනමුදු මෙය සර්විස්ගේ බුද්ධිමය හැකියාවන් හා ඔහුගේ ඥානයේ සීමා මායිම් ඉක්මවා යන තත්වයකි. ඒ වෙනුවට තේරුමක් නැති හා විකාර සහගත ආකාරයකට ඔහු, ආරම්භයේ සිට ම අප්‍රසාදයට පත්ව සිටින වෘත්තීය උපදේශකයෙකුගේ ආස්ථානයක සිට කටයුතු කරයි. "දේශපාලනය කරගසා නොගත්තේ නම් ට්‍රොට්ස්කිට, පුවත් පත් ලේඛකයෙකු හෝ රචකයෙකු ලෙස පහසුවෙන්ම ශ්‍රේෂ්ඨ වෘත්තීය ප්‍රගමනයක් අත්කර ගැනීමට ඉඩ තිබුනු" බව සර්විස් චරිතාපදානයේ හැඳින්වීමෙහි ලියා ඇත.

එහෙත් ට්‍රොට්ස්කි සිය වෘත්තීය ප්‍රගමනය තෝරාගත්තේ, දේශපාලනය තුල, විප්ලවකාරී දේශපාලනය තුලය. එම තීරනය ඉවසීමට හෝ එය ග්‍රහනය කර ගැනීමට සර්විස්ට පුලුවන් වූයේ නැත.

"රුසියාවෙන් පිටත, ට්‍රොට්ස්කිවාදියෙකු නොවන අයෙකු විසින් ලියන ලද ට්‍රොට්ස්කිගේ ප්‍රථම පරිපූර්න චරිතාපදානය" තම කෘතිය බව සර්විස් කියා සිටියි. [xxi] "පරිපූර්න" යන්නෙහි අරුත කුමක් ද? පිටු 501 ක් පුරා දිවෙන සර්විස්ගේ චරිතාපදානය සත්තකින්ම දිගු ය. එහෙත් අන්තර්ගතය අතින් බලන කල එය, තැචර් හා ස්වේන් විසින් නිම කරන ලද චරිතාපදානයන්ගේ විශාලත්වයෙන් සුපිරිවූ සංස්කරනයකට වැඩි යමක් නොවේ. මුල් කෘතීන් දෙක මෙන්ම මෙය ද ඉතිහාසයෙන් තොර චරිතාපදානයකි. විස්තර සඳහා අවශ්‍ය කෙරෙන මට්ටමකට යන්තමින් වත් පිවිසෙන කිසිවක් හෝ සමඟ එකදු ඓතිහාසික සිද්ධියක් හෝ යලි සිහිපත් කෙරී නැත.

සර්විස්, රුසියාවේ විප්ලවකාරී යුගයෙහි දැවැන්ත හා සංකීර්න නාටකය හිස් ප්‍රසංග පෙලකට ලඝු කරයි. ට්‍රොට්ස්කිගේ දේශපාලනික, පෞද්ගලික හා සදාචාරාත්මක යයි කියනු ලබන අසාර්ථකත්වයන් සර්විස් විසින් පරිහාසයට ලක් කිරීමේ දී පසුබිම් දර්ශනයක් පමනක් මෙ මඟින් සකස් කර දෙයි. 1933 වසරේ නාසිවාදීන් බලය අත් කර ගැනීම, ස්පාඤ්ඤ සිවිල් යුද්ධය පිපිරියාම, ප්‍රන්සයේ මහජන පෙරමුන පිහිටුවීම යන දෑ සාකච්ඡා කරන්නේ, එකිනෙකට අසම්බන්ධිත වැකි කිහිපයක් තුලිනි. මොස්කව් නඩු විභාග හා ත්‍රස්තය වෙනුවෙන් පවා වෙන් කර ඇත්තේ පිටුවකට නො වැඩි ප්‍රමානයකි. සර්විස් විසින් ඉමහත් වැඩි අවධානයක් යොමු කර ඇත්තේ ට්‍රොට්ස්කි, ෆ්‍රීඩා කාලො සමග කෙටි කලක් පවත්වාගෙන ගිය මිත්‍රත්වය කෙරෙහිය!

### දෝෂවලින් පිරි අච්චාරුවක්

තවද, ඓතිහාසික සාධක පිලිබඳව කතුවරයාගේ අතිශයින් සීමිත අවබෝධය පිලිබඳව අවධානයට ලක් කෙරෙන කරුනු කාරනා සහිත දෝෂවලින් චරිතාපදානය පිරී ඇත. විප්ලවකාරී ත්‍රස්තය පිලිබඳ විෂය ගැන ට්‍රොට්ස්කි 1917 වසරට පෙර දැරූ අදහස් තුලට මංමුලා සහගත ලෙස එබී බලමින් සර්විස් මෙසේ ලිවීය. "තමන්ගේ මධ්‍යම කාරක සභාවට රහසේ ඇතුලු වූ පොලිස් ඔත්තුකාර එව්නො අසෙව් සමාජවාදී-විප්ලවකාරීන් විසින් ඝාතනය කරන ලද අවස්ථාවේදී - 1909 වසරේ දී - ට්‍රොට්ස්කි 'පුද්ගලික ත්‍රස්තයට' එරෙහිව හඬනැගීය." [113] ඇත්ත වශයෙන්ම අසෙෆ් (රුසියානු අක්ෂර වින්‍යාසයෙන් නිවැරදිව ප්‍රකාශ කල විට), 1909 වසරේ දී ඝාතනයට ලක් නොවුනි. කෙදිනක හෝ ඔහු ඝාතනයට ලක්වුයේ ද නැත. සමාජවාදී විප්ලවකාරී පක්ෂය තුල ඔක්රානා සංවිධානයේ ඒජන්තයෙකු ලෙස ක්‍රියාකල සමයේ ඝාතන ඇතුලු ත්‍රස්තවාදී ක්‍රියා සංවිධානය කල අසෙෆ් තම නිරාවරනයෙන් පසුවත් නොනැසී සිටි අතර, 1918 වසරේ දී ස්වභාවික හේතූන් මත මරනයට පත් විය. අසෙෆ් සිද්ධිය පිලිබඳව ට්‍රොට්ස්කිගේ වැදගත් ලිපියෙන් එකදු වැකියක් වත් උපුටා දැක්වීමට සර්විස් අපොහොසත් වෙයි.

1923 වසරේ ජර්මානු සිද්ධීන් සාකච්ඡා කිරීමේ දී, බර්ලිනයේ "වීදි සටන් ක්‍රමයෙන් අඩු වී ගිය" පසු විප්ලවය අසාර්ථක වූ බව සර්විස් ප්‍රකාශ කර සිටී. [31] ඇත්ත වශයෙන්ම, බර්ලිනයේ සටන් පැවතුනේ නැත. අගනුවර තුල සටන් ඇරඹිය හැකි තත්වයක් එලඹීමට පෙර ම කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය නැගිටීම අත්හැර දමා තිබුනි. ප්‍රධාන ජර්මානු නගරයක බරපතල සටනක් ඇතිවුනේ නම් ඒ හැම්බර්ග්හි පමනි.

චීන විප්ලවය සම්බන්ධයෙන් අහඹු සඳහනක් කරමින්, 1927 අප්‍රේල්හි චියැංකායිෂෙක්ට හා කුවෝමින්ටෑං පක්ෂයට එරෙහිව කැරැල්ලක් දියත්කරන මෙන් කොමියුනිස්ට් ජාත්‍යන්තරය උපදෙස් දුන් බව සර්විස් කියා සිටී. "එය ෂැංහයි නගරයෙහි හා අනෙකුත් ස්ථානවල කොමියුනිස්ට්වාදීන්ට එරෙහිව ලේවැකි මර්දනයක් දියත් කිරීමට චියැංට නිදහසට කරුනු සම්පාදනය කිරීමක් විය." [355] මෙය වැරදිය. එවන් කිසිදු සැලසුමක් නොතිබුනි. එවැනි කිසිදු උපදෙසක් ද දී නැත. සර්විස්, 1927 අප්‍රේල් හි ෂැංහයි නගරයේ සිදුවීම් හා ඉන්පසු කැන්ටන් නගරයේ සිදුවීම් පටලවාගනී.

1928 ජුනියේ දී ට්‍රොට්ස්කි, කොමින්ටර්නයේ පස්වැනි සමුලුවේ වැඩපිලිවෙල නිරීක්ෂනය කරමින් සිටි බව තවත් වගන්තියක සර්විස් ලියයි. [371] ඇත්ත වශයෙන්ම, පස්වැනි සමුලුව පවත්වන ලද්දේ 1924 වසරේදී ය. සර්විස් සඳහන් කරන නිරීක්සනය කරන ලද්දේ හයවැනි සමුලුව පිලිබඳව ය.

ට්‍රොට්ස්කිගේ වැන්දඹු බිරිඳ වූ නටාලියා සෙඩෝවාගේ මරනය සිදු වූ වර්ෂය පවා සර්විස් වරද්දා

ගනී. "ඇය 1960 වසරේ දී මරනයට පත් විය. ඒ ඇගේ මෙක්සිකානු ප්‍රන්ස හා අමෙරිකානු මිතුරු ජාලයේ ඉමහත් ශෝකය මධ්‍යයේ ය." [496] ඇත්ත වශයෙන්ම සෙඩොවා මිය ගියේ 1962 ජනවාරියේ දීය. ඇය අවුරුදු 79 ක් ජීවත් වූවාය. ට්‍රොට්ස්කිගේ චරිතාපදායකයෙකු දැන සිටිනු ඇතැයි යමෙක් අපේක්ෂා කරන පරිදි, ඇගේ මරනයට මාස ගනනකට පෙරාතුව, මොස්කව් නඩු විභාගවල සමාලෝචනයක් හා ට්‍රොට්ස්කිගේ පුනරුත්ථාපනය ඉල්ලා සිටිමින් නටාලියා සෙඩෝවා, සෝවියට් ආන්ඩුව අමතා තිබුනි. කෘතිය අවසානයේ තවත් තදබල වරදක් කරමින් සර්විස්, ට්‍රොට්ස්කිගේ බාලම පුත් සර්ගෙයිගේ බිරිඳ හා දුව ඔහුගේ වැඩිමහල් පුත් ලෙව්ගේ බිරිඳ හා දුව ලෙස වරදවා හඳුන්වා දෙයි. [500-501] මේ වැරැද්ද හඳුනා නොගත්තේ මැක්මිලන් හා හාවඩ් විශ්වවිද්‍යාල මුද්‍රනාල සංස්කාරකවරුන් පමනක් නොවේ. සර්විස් අප දැනුවත් කරන ලද පරිදි අත්පිටපත මුලුමනින්ම කියවූ, එතරම් සුපරික්ෂාකාරී නොවන මහාචාර්ය තැචර්ගේ ඇසට ද එය මගහැරී ඇත.

තැචර් හා ස්වේන්ගේ එම ක්‍රියාමාර්ගයම අනුගමනය කිරීම නිසා සර්විස් ද ට්‍රොට්ස්කිගේ ලිපි ලේඛන කරා යොමුවීමට අපොහොසත් වෙයි. ට්‍රොට්ස්කිගේ *My Life* 'මගේ ජීවිතය' නමැති කෘතිය අවමානයට ලක්කිරීමට උස්සාහ දැරීම හැරුනු කොට සර්විස්, මෙම චරිතාපදානය ලිවීමට මත්තෙන් ට්‍රොට්ස්කිගේ ප්‍රකාශිත ග්‍රන්ථ හා ලිපිලේඛන කිසිවක් ක්‍රමානුකූලව අධ්‍යයන කල බවට පිලිගත හැකි සාධක ඇත්තේ නැත. තමා නොමසුරු ලෙස වර්නනා කරන ඉයන් තැචර්ගේ ලියවිලි හැරුනු විට, ට්‍රොට්ස්කි පිලිබඳව ලියවී ඇති ශාස්ත්‍රීය සාහිත්‍ය සම්බන්ධයෙන් සර්විස් අවධානය යොමු නොකල තරම්ය. ට්‍රොට්ස්කිගේ සාහිත්‍යය නිමැවුම බැරෑරුම් ලෙස පිලිගත්, මාක්ස්වාදී සම්ප්‍රධාය ප්‍රගුන කල, චරිතාපදාන කතුවරුන් කෙරේ සර්විස් දක්වන්නේ අවඥා සහගත ආකල්පයකි. බෙහෙවින් සම්මානයට පාත්‍රවූ ඉතිහාසඥයෙකු ද දැඩි පර්යේෂන වලින් පසුව විශ්වාස කටයුතු පරිදි ට්‍රොට්ස්කිගේ චරිතාපදානයක් ලියා පල කල කතුවරයෙක් ද වූ නැසීගිය පියර් බෲවේ, ට්‍රොට්ස්කි "වන්දනාමානය කරන්නෙකු" ලෙස සර්විස් විසින් ඉවත ලයි. ඩොයිෂ්චර්ට සමච්චල් කරන්නේ "ට්‍රොට්ස්කිගේ පූජාස්ථානයෙහි වැඳුම් පිඳුම් කල අයෙකු" ලෙස ය. [xxi]

සිය සංඥාපනයෙහි සර්විස් උඩින් පල්ලෙන් උපහාර දක්වන අනිකුත් ඉතිහාසඥයින් බොහොමයකගේ කෘතීන් ද ඔහු ඇත්ත වශයෙන්ම කියවා තිබේ ද යන්න සැකයට පාත්‍ර වීමට හේතු ඇත. නිදසුනක් වශයෙන් ට්‍රොට්ස්කි "සංශයවාදී පිරික්සුමට" ලක්කල ඉතිහාසඥයෙකු වශයෙන් මහාචාර්ය ඇලෙක්සැන්ඩර් රැබිනොවිච් සර්විස්ගේ නිරීක්ෂනයට හසුවන අතර සර්විස්, 1917 ඔක්තෝබරයේ බලය අල්ලා ගැනීමේදී ට්‍රොට්ස්කි කුමන හෝ වැදගත් භූමිකාවක් ඉටු කල බව අපහාසාත්මක ලෙස ප්‍රතික්ෂේප කරන ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයේ ජේම්ස් වයිට් සමග එකගොඩට දමයි. [xxi] ඇත්ත වශයෙන්ම, මහාචාර්ය රැබිනොවිච්ගේ *The Bolsheviks Come to Power* (බෝල්ශෙවික්වරු බලයට පත් වෙති) යන කෘතිය, බොල්ශෙවික් ජයග්‍රහනයේ උපායමාර්ගික ප්‍රමුඛත්වය හා ප්‍රායෝගික නායකත්වය ලෙස ට්‍රොට්ස්කිගේ භූමිකාව තහවුරු කරයි.

සිය චරිතාපදානය "පරිපූර්න" එකක් ලෙස හුවාදක්වන සර්විස්ගේ ස්වයං තෘප්ත විස්තරය කෙසේ වුව ද, ට්‍රොට්ස්කිගේ ප්‍රධාන දේශපාලන කෘතීන්ගේ උද්ධෘතයන් හෝ ඒවායේ ප්‍රමානවත් සම්පින්ඩිතයන් හෝ එහි නැත්තටම නැති තරම් ය. වසර 35 ක කාල පරිච්ඡේදයක් පුරා ට්‍රොට්ස්කිගේ දේශපාලන කාර්යභාරයේ පදනම වූ නොනවතින විප්ලවය පිලිබඳ න්‍යායේ මූලික සංකල්ප හා උපකල්පනයන් සමාලෝචනය කිරීමට පවා සර්විස් නැඹුරු නොවෙයි. බොහෝ කාන්ඩ වලින් පලව තිබෙන ට්‍රොට්ස්කිගේ චීනය, ජර්මනිය, ස්පාඤ්ඤය, ප්‍රන්සය හා බ්‍රිතාන්‍ය පිලිබඳ පොත්පත් පවා ඔහු සඳහන් නොකරන තරම් ය.

ට්‍රොට්ස්කිගේ කෘතින් අතුරින් එකක් ගැන හෝ සර්විස් සඳහනක් කරන අවස්ථා කිහිපයේ දී වුවත්, ඔහුට කීමට ඇති දේ වැඩි කොටම වැරදි ය. *Literature and Revolution* (සාහිත්‍ය හා විප්ලවය) නැමැති කෘතිය ගැන මුලුමනින්ම ව්‍යාකූල සඳහනක් කරමින් සර්විස්, පහත සඳහන් මතය ට්‍රොට්ස්කිට ආරෝපනය කරයි: "'නිර්ධන පන්ති සංස්කෘතියක්' පුලුල් ලෙස සාක්ෂාත්කර ගැනීමට බොහෝ කලක් ගත වනු ඇත." [317] 'සාහිත්‍ය හා විප්ලවය' නැමැති කෘතිය ඇත්ත වශයෙන්ම කියවූ ඕනෑම කෙනෙක් දන්නා පරිදි, "නිර්ධන පන්ති සංස්කෘතියක්" පිලිබඳ සංකල්පය ට්‍රොට්ස්කි දැඩි ලෙස ප්‍රතික්ෂේප කලේය. (**6**) එහෙත් සර්විස් එය නොදනී. ඒ එක්කෝ එම කෘතිය නොකියවූ නිසා ය. නැත්නම් එය වටහා ගැනීමට හැකියාවක් සර්විස් තුල නොතිබූ නිසා ය.

ට්‍රොට්ස්කිගේ ලියවිලිවලට අවධානයක් යොමු නොකර සර්විස් පිටු 501 ක් ලිවීමේ නිරත වන්නේ කෙසේ ද යන්න පිලිබඳ දැන් පාඨකයා තුල කුතුහලයක් ඇති වනු නිසැකය. තමන්ගේ බුද්ධිමය නිමැවුමට අවශ්‍ය අවධානය යොමු නොකර, 20 වැනි සියවසේ වඩාත්ම ප්‍රතිපලදායක ලේඛකයෙකු සම්බන්ධයෙන් "පරිපූර්න චරිතාපදානයක්" ලිවීමට හැකිවන්නේ කෙසේ ද?

## ට්‍රොට්ස්කිගේ "වලදැමූ ජීවිතය" ගොඩගැනීම

මේ ප්‍රශ්නය අපේක්ෂා කරමින් මෙන් සර්විස්, සිය කේන්ද්‍රීය උත්සුකය වන්නේ ට්‍රොට්ස්කි ලිවූ හෝ ඇත්ත වශයෙන් ඉටුකල දෑ සම්බන්ධයෙන් නොවන බව ආරම්භයේ දී ම සිය පාඨකයින්ට දන්වා සිටියි. "මේ කෘතියෙහි අරමුන වැලලූ ජීවිතය හාරා ගොඩ ගැනීමය" යි සර්විස් ලියයි. "සාක්ෂි ඇරඹෙන්නේ ඔහුගේ ජීවිත කාලය තුල ඔහු ප්‍රකාශයට පත් කල කෘතින් - පොත්පත්, ලිපි ලේඛන හා දේශන - තුලින්" බව ඔහු පිලිගනී. "එහෙත් එය ප්‍රමානවත් නොවේ. ට්‍රොට්ස්කිගේ ලියවිලි සියල්ල අධ්‍යයන කිරීමෙන් පවා අප දැනුවත් වනුයේ ඔහුගේ මහා අරමුනු ගැන පමනි. කිසියම් මොහොතක ඔහු තුල පැවති පෞද්ගලික හෝ කට්ටිවාදී අරමුනු එමගින් සැමවිට පැහැදිලි නොවේ. ක්‍රියාකාරී දේශපාලනඥයෙකු වශයෙන් තම කටයුතු පැහැදිලි කිරීමට ඔහුට සැමවිටම ඉඩ නොතිබුනි." [4-5]

සර්විස් තවදුරටත් මෙසේ ලියයි:

ඔහුගේ ලිඛිත උරුමය සමස්ත වෘතාන්තය බවට පත් වීමට ඉඩ නොතැබිය යුතුය. ඔහුගේ වෘත්තීය ප්‍රගමනයේ පර්යාලෝකය වඩාත් ඵලදායි ලෙස ප්‍රතිනිර්මානය කරනුයේ, උත්කෘෂ්ඨ ප්‍රසිද්ධ ප්‍රකාශන තුලින් නොව, නොවැදගත් යයි ඇතැම් විට සලකනු ලබන අවශේෂයන් තුලිනි: ඔහුගේ ජීවන ශෛලිය, ආදායම, නිවාස, පවුල් සබඳතා, සුපුරුදු හැසිරීම් හා මානව වර්ගයාගේ අවශේෂ පාර්ශවයන් ගැන එදිනෙදා උපකල්පනයන් තුලිනි. ...තවද ලෙනින් හා ස්ටැලින් සම්බන්ධයෙන් මෙන්ම, ට්‍රොට්ස්කි කථා කිරීමට තෝරාගත් හෝ ලිවූ දේ ගැන ද, ඔහු නිහඬ බව පලකල දේ ගැන ද, අවධානය යොමු කිරීම වැදගත් ය. *ඔහුගේ අප්‍රකාශිත මූලික උපකල්පනයන්, ඔහුගේ ජීවිතය පිලිබඳ සංයෝගයට නොවෙන්කල හැකි සේ බැඳී තිබුනි.* [අවධාරනය අපේ, 5]

තමන් ඇත්ත වශයෙන්ම සිතූ දේ අනිකුත් අයට නොකීම පිලිබඳව අතිශයින් සැලකිලිමත් වූ ස්ටැලින්ට මෙම ප්‍රකාශනය හා එකඟ වන්නට පුලුවන. මොස්කව් නඩු විභාග සංවිධානය කිරීමේ දී ස්ටැලින් විසින් උපයෝගී කරගන්නා ලද සංවික්ෂනාත්මක මූලධර්මයට මෙය මුලුමනින්ම අනුකූල විය. පැරනි බොල්ශෙවික් විත්තිකරුවන්ගේ ප්‍රසිද්ධ ප්‍රකාශන, ලිපිලේඛන හා කටයුතු තුල, සෝවියට් රාජ්‍යයට එරෙහි අපරාධ පිලිබඳ සාක්ෂි සොයාගත නොහැක. ඒ වෙනුවට, ඔවුන්ගේ ත්‍රස්තවාදී කුමන්ත්‍රන ගලා ආවේ ඔවුන්ගේ ප්‍රසිද්ධ වාර්තාවේ යටින් වෙස්වලාසිටි "ප්‍රකාශිත නොවූ මූලික උපකල්පනයන්'' තුලිනි.

මහාචාර්ය සර්විස්, ට්‍රොට්ස්කිගේ "ප්‍රකාශිත නොවූ මූලික උපකල්පනයන්" හාරා අවුස්සා ලබාගැනීමට අදහස් කරන්නේ කෙසේ ද? ට්‍රොට්ස්කිගේ ලියවිලිවල ප්‍රකාශයට පත් නොවුනු මුල් කාලීන කෙටුම්පත් පිරික්සීම තුලින් ඔහුගේ "වලලන ලද ජීවිතය" අනාවරනය කරගත හැකි වනු ඇතැයි සර්විස් නිවේදනය කරයි. "කපාහැරීම් හා සංශෝධන, අනිකුත් අයගෙන් වසං කල යුතු බවට ඔහු සැලකූ දේ අපට කියා දෙයි. මෙය විශේෂයෙන් සත්‍ය වන්නේ ඔහු විසින් රචිත තමන්ගේම ලිඛිත චරිතාපදානයට අදාලවය." [5]

මෙම ප්‍රකාශනය ට්‍රොට්ස්කිට එරෙහි සර්විස්ගේ ප්‍රධාන චෝදනාවේ පදනම සකස් කරයි. එනම්, 1930 වසරේ ට්‍රොට්ස්කි ලිවූ 'මගේ ජීවිතය' නමැති චරිතාපදානය විශ්වාසය තැබිය නොහැකි හා සැක කටයුතු කෘතියක් ය යන්නය. ට්‍රොට්ස්කි විසින් "තමන් පිලිබඳව කරන ලද විස්තරය, පාඨක පරම්පරා ගනනාවක් විසින් අවිවේචනාත්මකව පිලිගෙන ඇති බවට" සර්විස් මැසිවිලි නගයි. "යථාර්ථය එයට හාත්පසින්ම වෙනස් ය. මන්දයත්, තමන් ඇලුම් කල ප්‍රතිරූපය, ඔහු අපහසුතාවයට පත්කරන කරුනු මගින් අඳුරුවුයේ නම්, ඔහු ඒවා ඉවත් කලේ ය. නැත්නම්, විකෘති කලේ ය." [11]

## *ට්‍රොට්ස්කි අපහසුවට පත්වූ අවස්ථා*

'මගේ ජීවිතය' කෘතියෙහි ට්‍රොට්ස්කි නිශ්චිතව වසන් කලේ හෝ බොරු කලේ කුමක් ද? ස්ටැන්ෆ්‍රඩ් විශ්වවිද්‍යාලයේ හූවර් ආයතනයේ තැන්පත් කොට ඇති, ට්‍රොට්ස්කි විසින්ම තමන් ගැන ලිවූ චරිතාපදානයේ පලමු කෙටුම්පත, ප්‍රකාශිත සංස්කරනය හා සැසඳූ විට, ප්‍රධාන විෂමතා දෙකක් තමන් සොයාගත් බව සර්විස් කියා සිටී. ඉන් පලමුවැන්න, සිය පියාවන ඩේවිඩ් බ්‍රොන්ස්ටයින් සතු ධනයේ ප්‍රමානය වසන් කිරීමට ට්‍රොට්ස්කි විසින් දරන ලදැයි කියනු ලබන උත්සාහයන් ය. සර්විස්, බලවත් අවධානයක් යොමු කරන දෙවැන්න, සිය යුදෙව් මූලයන්ගේ වැදගත් වැදගත් කම ලඝු කොට දැක්වීමට ට්‍රොට්ස්කි විසින් දරන ලැදැයි කියනු ලබන උත්සාහයන් ය.


සර්විස් මෙසේ ලියයි:

සිය දෙමාපියන් සතු ධනය මුල්කරගෙන, මාක්ස්වාදියෙකු වශයෙන් ඔහු අපහසුතාවකට පත් වුනි. ඔවුන්ගේ අසාමාන්‍ය ගතිගුන හා ජයග්‍රහන කිසිදිනක ඔහු හරියාකාරව ඉදිරිපත් කලේ නැත. ඊට වැඩිමනක්ව තමා කුලැටි හෝ පමනට වඩා සැප සම්පත් භුක්ති විඳි පුද්ගලයෙකු සේ පෙනී ගිය ඡේද, ඔහු ස්වයං ලිඛිත චරිතාපදානයේ සිය ළමා කාලය පිලිබඳ ප්‍රකාශිත විස්තරයෙන් අත්හැර දැමීමට පෙලඹුනි; සිය යුදෙව් මුලාරම්භය ප්‍රතික්ෂේප නොකර, ඔහු ඒ පිලිබඳව කරන ලද සැඳහුම් කප්පාදු කර දැමීය. කෙටුම්පත් හා සෝදුපත් පිරික්සීම තුලින් ඔහුගේ ළමාකාලය ගෙවීගිය ආකාරය පිලිබඳ බොහෝ කලක් සැඟවී තිබූ අංශයන්ගේ දසුන් යාන්තමින් අපට ලබාගත හැක. ඒ අනුව ඔහු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කලේ තම පියා සමෘද්ධිමත්, කාර්යක්ෂම

ගොවියෙකු බව පමනි. මෙය, යථාර්තය බෙහෙවින් අඩු තක්සේරු කිරීමකි. අනෙටා සමග විවාහ වී සිටි ඩේවිඩ් බ්‍රොන්ස්ටයින්, කේර්සන් පලාතේ සැතපුම් ගනනාවකට සිටි වඩාත් ශක්තිමත් ගොවීන් අතුරින් කෙනෙකු විය. උද්යෝගිමත්ව වැඩ කිරීම හා අධිෂ්ඨානය තුලින් ඔහු, ආර්ථික සාර්ථකත්වයේ ඉනිමගෙහි මහන්සියෙන් ඉහලට නැගගත්තේ ය. සිය ජයග්‍රහනය ගැන ආඩම්බරවීමට ඔහුට සෑම අතින්ම අයිතියක් තිබුනි.” [12]

සිය පියාගේ ධනයේ වැදගත්කම අඩුකොට දැක්වීමට හා සිය ජනවාර්ගික හා ආගමික පසුබිම වසන් කිරීමට ට්‍රොට්ස්කි උත්සුක වූ බවට සර්විස් නගන චෝදනාවට පිලිතුරු දීමට මත්තෙන්, යට සඳහන් ප්‍රකාශයට පාදක වූ සැකකටයුතු ස්වභාවය වෙත අපි ප්‍රථමයෙන් ම අවධානය යොමු කරමු. එනම්, පූර්ව ස්වරූපය කරා කෙටුම්පත් වල ප්‍රගමනය හොඳින්ම වටහා ගත හැක්කේ, වසන් කිරීමේ හා මුසාකරනයේ ක්‍රියාවලියක් ලෙසය යන්න. තමා ප්‍රථමයෙන් ඔප්පු කල යුතු දෙය සර්විස් අවධාරනය කර සිටී. ඔහු තම චෝදනාව තහවුරු කිරීමට නම්, ට්‍රොට්ස්කිගේ “කපා හැරීම් හා සංශෝධන” ශ්‍රේෂ්ට නිර්මානකරුවෙකු විසින් ශිල්පීය අභිමතය උචිත ලෙස භාවිත කිරීමක් ලෙස එය නොසැලකිය යුතු වන්නේ මන්දැයි ඔහු පෙන්වා දිය යුතුය. ඇතැම් වගන්ති ඉවත් කර තවත් ඒවා එකතු කිරීම සඳහා ට්‍රොට්ස්කිට, වසන් කිරීමේ අභිප්‍රායකින් තොරවූ හේතු ගනනාවක් තිබුනා විය හැක.

සිය ළමා කාලය පිලිබඳ ට්‍රොට්ස්කිගේ ප්‍රකාශිත විස්තරය, මුල් කාලීන කෙටුම්පත් වලින් වෙනස් වීම පිලිබඳ කිසිදු ආකාරයකින් හෝ වැදගත් වන එකද නිදසුනක්වත් සැපයීමට සර්විස් අපොහොසත් වෙයි. කෙසේ වුව ද, සර්විස්ගේ චෝදනා, කිසි ලෙසකින්වත් මොනම හරවත් භාවයකින් හෝ තොරය. ට්‍රොට්ස්කි “තම දෙමව්පියන්ගේ ධනය මුල්කොටගෙන අපහසුතාවකට පත්විනැ”යි යන ප්‍රකාශය තහවුරු කිරීමට සර්විස්ට තමාගේම පරිකල්පනය හැරුනු විට අන් කිසිදු සාක්ෂියක් නොමැත. ඩේවිඩ් බ්‍රොන්ස්ටයින් සැලකිය යුතු ධනයක් උපයා ගත්තේ ට්‍රොට්ස්කි නිවසින් ඉවත් වී සෑහෙන කලක් ගිය පසුව බව පෙන්වා දිය යුතු නමුදු, ට්‍රොට්ස්කිගේ විස්තරය තුල සිය පියාගේ නැගී එන සමෘධිමත් බව සටහන් කර තිබේ. අනාගත විප්ලවවාදියාගේ වයස අවුරුදු 17ක් වන තෙක්, ට්‍රොට්ස්කි උපත ලද කටුමැටි නිවසෙහි සිට, ගඩොලින් තැනූ ගෙයකට බ්‍රොන්ස්ටයින් පවුල මාරු වුයේ නැත. එනමුදු, සමාජය තුල හිස එසවීමටත්, ධනය එක් රැස් කිරීමටත් සිය පියා ගෙන ගිය නිර්දය අරගලය පිලිබඳව සාරවත්, සවිස්තර හා සෙනෙහෙබරවූ විස්තරයක් ට්‍රොට්ස්කි ‘මගේ ජීවිතය’ නමැති කෘතිය තුල සපයා තිබේ. ළමයෙකු වශයෙන් තම සමාජ තත්වය ට්‍රොට්ස්කි මෙසේ සටහන් කරයි. “සමෘධිමත් ඉඩම් හිමියෙකුගේ පුතෙකු වශයෙන් මා අයත් වූයේ පීඩිත පන්තියට නොව, වරප්‍රසාදිත පන්තියටය.” [*My Life,* මගේ ජීවිතය (නිව් යෝර්ක්: ඩෝවර්, 2007), 87 වැනි පිටුව]




**මැක්ස් ඊස්ට්මන්ගේ තරුන ට්‍රොට්ස්කි**

ඩේවිඩ් බ්‍රොන්ස්ටයින් “පොහොසත් වූයේ වැඩ කිරීමෙන් හා තමන් සමග වැඩ කිරීමට ගොවීන් කුලියට යොදා ගැනීමෙන් ” යයි ට්‍රොට්ස්කිගේ මුල් කාලීන ජීවිතය පිලිබඳ මැක්ස් ඊස්ට්මන් විසින් 1926 වසරේ රචිත චරිතාපදාන විස්තරයෙහි ප්‍රකාශිත වේ. ඉයනොව්කා නමැති කුඩා යුක්‍රේනියානු ගම අවට ඉඩම් අක්කර 3000 ක් පමන පාලනය කල, ධාන්‍ය මෝලකට හිමිකම් කිවූ, එහි වාසය කල වැදගත්ම පුද්ගලයා ඔහු විය. ඊස්ට්මන් ඒ කරුනු දැන ගත්තේ ට්‍රොට්ස්කි ඒවා ඔහුට විස්තර කල නිසාය. ඊස්ට්මන් මෙසේ ලීවේය. “ට්‍රොට්ස්කි සිය පියා ගැන ආඩම්බර විය. වැඩපල වල යෙදී සිටිය දී අවබෝධයක් ඇතිව ඔහු මිය යෑම පිලිබඳව ට්‍රොට්ස්කි ආඩම්බර විය. ඔහු ගැන කතා කිරීමට ට්‍රොට්ස්කි දැඩි ඇල්මක් දැක්වීය.” [*The Young Trotsky,* තරුන ට්‍රොට්ස්කි (ලන්ඩන් : නිව් පාක්, 1980, 3 වැනි පිටුව)]

බ්‍රොන්ස්ටයින් පවුල ගැන සර්විස්ගේම විස්තරය තුල, මේ පවුල ඔහු හඳුන්වන්නේ “ධෛර්යමත් යුදෙව්වන්” [14] ලෙසය. එය මුලුමනින්ම පදනම් වී ඇත්තේ ‘මගේ ජීවිතය’ හා ඊස්ට්මන්ගේ ‘තරුන ට්‍රොට්ස්කි’ යන කෘති වල පල කරන ලද කරුනු මතය. ට්‍රොට්ස්කි හා ඊස්ට්මන් විසින් සපයන ලද තොරතුරු වලට යමක් එකතු කිරීමට හෝ එම තොරතුරු නිශ්ප්‍රභා කිරීමට හෝ සර්විස් අලුත් හා ස්වාධීන පරීක්ෂන වල යෙදී නැත. මුලින් ලියන ලද කෘතීන් හා ඈඳිය නොහැකි කිසිදු සවිස්තරයක් ට්‍රොට්ස්කිගේ මුල් කාලය පිලිබඳව සර්විස්ගේ විස්තරයෙහි නොමැත.

ට්‍රොට්ස්කිගේ ස්වයං චරිතාපදානයේ විශ්වාසය තැබිය නොහැකි අවස්ථා ලෙස හෙළිදරව් කිරීමට තමා සමත් වූ බවට ඔහු කර ඇති ප්‍රකාශ සැලකිල්ලට ගත් කල, වඩාත් පුදුම එලවන සුලු කරුන වන්නේ, ට්‍රොට්ස්කිගේ තරුන කාලය නිරූපනය කිරීම

සම්බන්ධයෙන් සර්විස් විශ්වාසය රඳවන්නේ මුල් කෙටුම්පත මත නොව, මුලුමනින්ම පාහේ 'මගේ ජීවිතය' කෘතියේ, ප්‍රකාශිත සංස්කරනය මතය යන්නය. "ඇති දැඩිවූ ළමා කාලය" යන හිසින් යුතු සිය චරිතාපදානයේ දෙවැනි පර්ච්ඡේදය තුලට, ට්‍රොට්ස්කිගේ ස්වයං චරිතාපදාන ලියවිල්ලෙන් සැලකිය යුතු ප්‍රමානයේ උධෘත නවයක් සර්විස් ඇතුලු කරයි. ඉන් අටක් ප්‍රති උත්පාදනය කර තිබෙන්නේ 'මගේ ජීවිතය' කෘතියේ ප්‍රකාශිත සංස්කරනයෙනි ; මුල් කෙටුම්පතින් ගෙන ඇත්තේ එක උධෘතයක් පමනි. ප්‍රකාශිත කෘතිය හා කෙටුම්පත් අතර වැදගත් ප්‍රභේදයකට ඇඟිලි දිගු කිරීමට එකම අවස්ථාවකදීවත් සර්විස් සමත් වී නැත.

'මගේ ජීවිතය' කෘතියේ කෙටුම්පත ගවේෂනය කිරීමේදී සර්විස් කිසිවක්ම සොයා නොගත් බවක් මින් අදහස් නොකෙරෙයි. නිදසුනක් වශයෙන්, ස්වයං ලිඛිත චරිතාපදානයේ ප්‍රකාශිත සංස්කරනය තුල, ට්‍රොට්ස්කි විසින් කාල්සන් ලෙස හඳුන්වන ලද තරුන පාසැල් මිතුරෙකු, කෙටුම්පතෙහි හඳුන්වාදී ඇත්තේ ''ක්‍රෙයිට්සර්" ලෙස බව ඔහු සොයාගනී. අදෝ ලිපියක් තුල සර්විස් විසින් උඬගු ලෙස සටහන් කරන මේ සොයාගැනීම, සත්තකින්ම ට්‍රොට්ස්කි අධ්‍යයන ක්ෂේත්‍රයේ මහා සොයාගැනීමක් ලෙස හුවා දක්වනු ඇත! අන් කිසිවක් ඉටු කර ගෙන නැතත් ඔහු, එක් දැවැන්ත අධෝලිපියක් තුලින් තරුන ක්‍රෙයිට්සර්ගේ නම ඉතිහාසයෙහි එයට හිමි නියම තැනට සර්විස් විසින් ඔසවා තබා ඇත.

**මතු සම්බන්ධයි**

**සටහන්:**

1. "විද්‍යාව හා විලාසිතාව" *In Defence of Maxism* මාක්ස්වාදයේ ආරක්ෂාව සඳහා, (ලන්ඩන් නිව්පාක් 1971, 233 පිටුව)

2. *Russian Revieve:* රුසියානු විශ්ලේෂනය 14 වෙලුම, (1955 අප්‍රේල්) 151,152 පිටු.

3. *Defend The Realm:The Authorized History of MI5,* by Christopher Andrew බලන්න. (නිව් යෝර්ක්, ඇල්ෆ්‍රඩ් ඒ ක්නොෆ් 2009) *and Spycacher by Peter Wright* (නිව් යෝර්ක් පෙන්ගුයින්, 1987)

4. *ලියොන් ට්‍රොට්ස්කි සහ ඓතිහාසික මුසාකරනයේ පශ්චාත් සෝවියට් ගුරුකුලය* (කම්කරු මාවත ප්‍රකාශන) ඩේවිඩ් නෝර්ත්.

5. මෙහිදී සැලකිය යුතු වන්නේ, ජෙෆ්රි ස්වේන් විසින් මීට පෙර වර්ධනය කල ආස්ථානයට සර්විස් ද සමීපව බැඳී සිටින බවයි. "ට්‍රොට්ස්කි යථාර්තයේදී පෙනී සිටියාට වඩා බෙහෙවින් ශ්‍රේෂ්ඨ දාර්ශනිකයෙකු ලෙස" දැකගනු ලැබූ බවට ඔහු පැමිනිලි කලේ ය. "ට්‍රොට්ස්කි ඉමහත් ප්‍රමානයක් ලියා ඇති අතර, ලේඛකයෙකු ලෙස ඔහු, තමා සුලුවෙන් දැනසිටි මාතෘකා පිලිබඳව ලිවීමට නිතරම මහත් රුචියක් දැක්වීය" (3) එසේම සර්විස් 2004 වසරේදී සෝවියට් ආඥාදායකයා හා මහා ජන ඝාතකයෙකු වූ ස්ටැලින්ගේ චරිතාපදානය රචනා කිරීමේදී ඊට වඩා බොහෝ ගරුත්වයකින් යුතුව එය සිදු කලේය යන්න ද මෙහිදී සැලකිල්ලට ගත යුතුය. සර්විස් මෙසේ ලිවීය. "ස්ටැලින් කල්පනාභරිත මිනිසෙකු විය, එසේම ඔහු සිය ජීවිත කාලය පුරාම තමන් මනුෂ්‍යවර්ගයා පිලිබඳව ලත් අවබෝධය මත බුද්ධිමත් ව කටයුතු කිරීමට උත්සාහ කලේය. ඔහු විශාල ප්‍රමානයක් අධ්‍යයනය කල ද අමතක කලේ ස්වල්පයකි. නෛසර්ගිකව ඔහු චින්තකයෙක් හෝ ලේඛකයෙක් නොවීය. එහෙත් ඔහු සිය දිවියේ අවසානය දක්වාම බුද්ධිමතෙක් විය." *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* 2005 ජූනි මස පලවූ සර්විස්ගේ ස්ටැලින් පිලිබඳ ෆ්‍රෙඩ් විලියම්ස් කල සමාලෝචනය බලන්න.

6. 1920 ගනන් මුල "නිර්ධනපන්ති කුලකයේ" යෝජකයන්ට එරෙහිව ට්‍රොට්ස්කි මෙසේ තර්ක කලේය. නිර්ධන පන්තිය පීඩිත පන්තියක් වන බැවින් එයට තමන්ගේම සංස්කෘතියක් නිර්මානය කරගත හැකි නොවේ. පන්ති ආඥාදායකත්වයක අවශ්‍යතාව පැන නොනඟින, නිෂ්පාදන බලවේගයන්ගේ ඉතා ඉහල සංවර්ධනයක පදනම් මත හිස ඔසවන අනාගත සංස්ංකෘතියක "පන්ති අන්තර්ගතයක් නොපවතිනු ඇත. මෙයින් පහත සඳහන් නිගමනයට එලඹිය හැකි බව පෙනීයයි. එනම්, නිර්ධන පන්තික සංස්කෘතියක් නොපවත්නේ යයි ද අනාගතයේ පවා නොපවතිනු ඇතැයි ද සැබවින්ම එය පසුතැවිල්ලට කාරනයක් නොවන්නේය යන්නය. නිර්ධන පන්තිය බලය අත්කර ගන්නේ, පන්ති සංස්කෘතියෙන් සදහටම විමුක්තවීමේ හා මානව සංස්කෘතියකට ඉඩ සැලසීමේ අරමුන සහිතවය. අපට නිතරම පාහේ එය අමතකවී යන සෙයක් පෙනෙන්නට තිබේ." (චිකාගෝ, හේමාරකට් ප්‍රකාශන, 2005, 155 පිටුව)

© www.wsws.org